**රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 30 - 2023**

**-------------------------------------------------------------------**

**1. විගනණ මතය**

1.1 රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 30ක 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන හා මුදල් ප්‍රවාහ ප්‍රකාශන, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් සහ සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58 (1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 30කට අදාළව නිකුත් කර තිබුණු විගණන වාර්තා 30 හි තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර ඇති අතර, තත්ත්වාගණනය කළ මතය සඳහා හේතු වී තිබුණු ප්‍රමාණාත්මක දෝෂ පහත දැක්වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන**

**1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති ඇතුළුව ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම**

| | කාරක සභාව/කාරකසභා | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ඇහැළියගොඩ, කුරුවිට, ඕපනායක, රත්මලවින්න, නාමල්දෙණිය | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම වත්කම් ද්‍රවශීලතාව අඩු වත්කමේ සිට අනුපිළිවෙලට පෙළගස්වා නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව | ජංගම වත්කම් ද්‍රවශීලතා අනුපිළිවෙලට පෙළගැස්විය යුතුය. |
| (ආ) | අයගම, ගොඩකවෙල, පැල්මඩුල්ල, පොතුපිටිය | ක්ෂය ප්‍රතිශත මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරියේ දී හෙළිදරව් කිරීමට කටයුතු කරන බව | ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | අම්බැවිල, දාමහන, ඕබරබොටුව, ඇහැළියගොඩ, ඇලපාත,ගිලීමලේ, පොතුපිටිය, කල්තොට, නාමල්දෙණිය | කල් ඉකුත් වූ අලෙවි කළ නොහැකි රු.678,110 ක තොග හා භෞතිකව නොපැවතුණු රු. 1,745,144 ක තොග ජංගම වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | කොමසාරිස් අනුමැතිය ලබාගෙන පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කරන බව | විධිමත් අනුමැතීන් යටතේ ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

| | කාරක සභා | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | අම්බැවිල, දොඩම්පෙ, වැලිගෙපොල, ගොඩකවෙල | රු. 2,169,733 ක අවසන් තොගය, ගැනුම් පිරිවැය පමණක් සළකා අගය කිරීම සිදුකර තිබුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) | පඹගින්න,අම්බැවිල ඇලපාත, ගොඩකවෙල, කොලොන්න, කුරුවිට,පනාමුර තිඹොල්කැටිය | රු. 3,792,523 ක ජංගම නොවන වත්කම් ගිණුම්ගතකර නොතිබුණි. | -එම - | -එම - |
| (ඇ) | බඹරබොටුව, තිඹොල්කැටිය | ශේෂ පිරික්සුමේ ඇතුළත් ගිණුම් විෂයයන් 370ක් සඳහා ලෙජර් ගිණුම් පිළියෙල කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත | -එම- |
| ( ඈ) | පඹගින්න අයගම, ගොඩකවෙල, කහවත්ත, පැල්මඩුල්ල, රාස්සගල , තිඹොල්කැටිය, රත්මලවින්න, කිරිඇල්ල | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කිරීමේදී සිදු වූ ගිණුම්කරණ අඩුපාඩු හේතුවෙන් වර්ෂයේ අතිරික්තය රු. 1,352,232 කින් හා ශුද්ධ වත්කම් රු. 694,148 කින් අඩු වී තිබුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගිණුම නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ඉ) | ඇහැලියගොඩ, ඕපනායක, අම්බැවිල,කුරුවිට රාස්සගල,නිවිතිගල නාමල්දෙණිය | එකතුව රු.21,170,014ක වටිනාකමින් යුත් ජනල් වවුචර් 177ක් පිළියෙල කර අනුමත කර නොතිබුණි. | ඉදිරියේ දී ජනල් සටහන් පිළියෙල කර ඊට අවශ්‍ය අනුමැතිය ලබා ගන්නා බව | ජනල් සටහන් පිළියෙල කර අනුමැතිය ලබා ගත යුතුය. |

### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

| | කාරක සභා | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | කුරුවිට | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ වූ ලැබිය යුතු පොළී රු. 258,567ක් සම්බන්ධයෙන් අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි. | පිළිතුරු ලබා දී නොමැත | අදාළ ලේඛන නිවැරදිව තබා ගත යුතුය. |
| (ආ) | අම්බැවිල, අයගම, දොඩම්පෙ, ඇහැළියගොඩ, කල්තොට | ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් නොවීම නිසා එකතුව රු. 3,265,320 ක් වූ ගිණුම් විෂයයන් 19ක් තහවුරු කරගත නොහැකි විය. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව | -එම- |

### 1.3.4 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| කාරක සභාව/ කාරක සභා | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| කහවත්ත,පඹහින්න, නිවිතිගල ,වැලිගෙපොල, රත්නපුර ,රාස්සගල රත්මලවින්න, තිඹොල්කැටිය, | ගිණුම් විෂයයන් 10 ක මූල්‍ය ප්‍රකාශන අනුව වට්නාකම අනුරූපී වාර්තා අනුව වට්නාකම සමහ සැසඳීමේදී රු.18,093,828 ක වෙනසක් පැවතිණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව | මූල්‍ය ප්‍රකාශන ඊට අනුරූපී වාර්තා සමග සැසදිය හැකි විය යුතුය. |

**1.3.5 අවිනිශ්චිත ගිණුම්**

| කාරක සභාව/ කාරක සභා | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අම්බැවිල, වැලිගෙපොල, පනාමුර, දාමහන, තිඹොල්කැටිය, ඇඹිලිපිටිය | වර්ෂ 8 ත් වර්ෂ 42 ත් අතර කාලපරාසයක සිට පැවත එන හර ශේෂ 04 ක එකතුව රු.109,809 ක් හා බැර ශේෂ 03 ක එකතුව රු.35,665 ක් විය. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අවිනිශ්චිත ගිණුම් නිරවුල් කළ යුතුය. |

**1.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | කාරක සභාව/ කාරක සභා | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | | 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත | | | |
| i. | පඹගින්න ඕපනායක රාස්සගල රත්මලවින්න කල්තොට ඇලපාත | 14 වගන්තිය | අඳ ගොවින්ගෙන් ඉකුත් වර්ෂවල දී ලද රු.436,208 ක අඳ ගොවි ප්‍රවේණි මුදලක් අදාළ ඉඩම් හිමියාට ගෙවා නොතිබුණි. | ඉදිරියේ දී එම මුදල් ගෙවීමට කටයුතු කරන බව | පනත අනුව කටයුතු කළ යුතුය. |
| ii. | ගොඩකවෙල ඕපනායක වැලිගෙපොල තිඹොල්කැටිය කල්තොට | 22 වගන්තිය | කෘෂිකාර්මික ඉඩම්වලට සුදුසු වන බෝග හා ඇති කළහැකි සතුන් කවරේදැයි නිශ්චය කිරීමට වැඩපිළිවෙලක් නොතිබුණි. | ඉදිරියේ දී පිළිගත හැකි වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන බව | -එම- |

| | | | | | |
|---|---|---|---|---|---|
| iii. | ඇහැළියගොඩ, ඇලපාත, ගිලීමලේ, රත්නපුර, නිවිතිගල, අයගම, පැල්මඩුල්ල, කුරුවිට | 30 වගන්තිය | වගා කළ හැකිව තිබූ එකතුව අක්කර 4259 රූඩ් 737 පර්චස් 437 ක වපසරියක් සහිත කුඹුරු ඉඩම් ප්‍රමාණයක් පුරන්ව තිබුණි. | ඉදිරියේ දී කුඹුරු ඉඩම් අස්වැද්දීමට කටයුතු කරන බව | -එම- |
| iv. | අයගම ගිලීමලේ කහවත්ත නිවිතිගල ඕපනායක පනාමුර පැල්මඩුල්ල පොතුපිටිය රාස්සගල තිඹොල්කැටිය මාරපන බඹරබොටුව දාමහන | 56 (1) වගන්තිය | 2023 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 1,424,712 ක හිඟ අක්කර බදු ශේෂයක් පැවතුණි. | දීර්ඝකාලීනව අය නොවන ශේෂ කපා හැරීමට අනුමැතිය ඉල්ලා ඇති බවත්, හිඟ බදුවලින් කොටසක් අය වී ඇති බවත්, ඉතිරි මුදල් සැලසුම් සහගතව අයකර ගැනීමට කටයුතු කරන බව. | -එම- |
| (ආ) | ඇහැළියගොඩ රත්නපුර නාමල්දෙනිය කහවත්ත කුරුවිට ඕපනායක | 1981 ඔක්තෝබර් 16 දිනැති අංක 107 දරන ගොවිජන සේවා කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛයේ 30.4 ඡේදය | ජංගම නොවන වත්කම් ක්ෂය කිරීම සඳහා ඇති උපදෙස්වලට පටහැනිව ක්ෂය කිරීමේ අනුපාත හා ක්‍රම අනුගමනය කර තිබුණි. | ඉදිරියේ දී නිවැරදි ක්ෂය කිරීමේ අනුපාත හා ක්‍රම අනුගමනය කරන බව | චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | අයගම බඹරබොටුව දොඩම්පෙ ඇලපාත | 1986 ඔක්තෝබර් 21 දිනැති අංක 264 දරන ගොවිජන සංවර්ධන | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව, දීර්ඝ කාලයක සිට පැවත එන | හිඟ කාමර කුලීවලින් කොටසක් දැනටමත් අය වී | චක්‍රලේඛය අනුව අයකර ගත යුතු ය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ඇඹිලිපිටිය ගිලීමලේ කොලොන්න නිවිතිගල පනාමුර පොතුපිටිය | කොමසාරිස්ගේ චක්‍රලේඛය | 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු කාමර කුලී රු. 1,085,274 ක් විය. | ඇති බවත්, දීර්ඝකාලීනව තොරතුරු නොමැති ශේෂ කපා හැරීමට අනුමැතිය ඉල්ලා ඇති බවත්, ඉතිරි ශේෂ සැලසුම් සහගතව ඉදිරියේ දී නිරවුල් කිරීමටත් කටයුතු කරන බවත්ය | |
| (ඈ) | අම්බෑවිල අයගම ඇහැළියගොඩ කහවත්ත කුරුවිට ඕපනායක පැල්මඩුල්ල වැලිගෙපොල රත්නපුර තිඹොල්කැටිය කල්තොට නාමල්දෙනිය පඹහින්න ගොඩකවෙල | 2012 පෙබරවාරි 29 දිනැති 04/2012 දරන චක්‍රලේඛය 5.6(1) ඡේදය | ගොවිජන බැංකුවට අදාළ සියලුම ගිණුම් ගොවිජන සේවා කාරක සභාවේ වාර්ෂික අවසන් ගිණුම්වලට ඇතුළත් කර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වුවත්, එසේ සිදු කර නොතිබුණි. | ඉදිරියේ දී ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන බව. | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ඉ) | | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| i. | පඹහින්න කහවත්ත කලවාන රාස්සගල රත්මලවින්න කිරිඇල්ල බඹරබොටුව දොඩම්පෙ | මුදල් රෙගුලාසි 237 (ආ) | එකතුව රු.2,767,079 ක ගෙවීම් 145ක් වෙනුවෙන් තොග සහතික නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව | මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| ii. | කොලොන්න, රත්නපුර, කලවාන, රාස්සගල, දොඩම්පෙ, නාමල්දෙනිය, කල්තොට, පඹහින්න, ඕපනායක, ඇහැළියගොඩ, මාරපන කුරුවිට අම්බැවිල, ඇඹිලිපිටිය වැලිගපොල | මුදල් රෙගුලාසි 257 | කාරක සභාව සහ ගොවි බැංකුව සඳහා මෘදුකාංග පද්ධතියක් සකසා ගැනීමට රු. 3,753,977ක මුදලක් ප්‍රධාන කාර්යාලයට ගෙවා තිබුණද සමාලෝචිත වර්ෂය තුළ අදාළ උපකරණ හා මෘදුකාංග පහසුකම් ලැබී නොතිබුණි. | ගොවිජන සේවා දිස්ත්‍රික් කාර්යාලය විසින් ගන්නා ලද තීරණයක් මත මෙම මිලදී ගැනීම් සඳහා ගෙවීම් සිදු කළ බව. | -එම- |
| (ඊ) | අම්බැවිල ගොඩකවෙල වැලිගෙපොල තිඹොල්කැටිය කල්තොට | 2018 අංක 19 දරන ජාතික විගණන පනත 38( ඊ) වගන්තිය | ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | ඉදිරියේ දී ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකරන බව | අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ගොවිජන සේවා කාරක සභා 17ක ශුද්ධ මෙහෙයුම් වර්ධනය රු.10,704,203ක් හා ගොවිජන සේවා කාරක සභා 13ක ශුද්ධ මෙහෙයුම් පිරිහීම රු.2,471,758ක් විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | කාරක සභාව/ කාරක සභා | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | කල්තොට | 2010 වර්ෂයේ සිට පැවත එන එකතුව රු4,259,209.ක ගිණුම් ශේෂ , පරීක්ෂණ කටයුතු අවසන් කර නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි . | පිළිතුරු ලැබී නොමැත. | නොපමාව නිරවුල් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | දාමහන, ගොඩකවෙල, වැලිගෙපොල, අම්බැවිල | වාරි කර්මාන්ත ප්‍රතිසංස්කරණය නොකිරීම හේතුවෙන් 2023 වර්ෂයේ ලය කන්නය සඳහා වගා හානි වෙනුවෙන් රු.16,457,263 ක් ගෙවීමට සිදු වී තිබුණි. | ප්‍රතිපාදන ලැබී නොතිබීම. | වාරි කර්මාන්ත ප්‍රතිසංස්කරණය කඩිනමින් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | දාමහන, නිවිතිගල, අයගම, ගිලීමලේ, කිරිඇල්ල ,දොඩම්පෙ, ඇලපාත, මාරපන, ඇඹිලිපිටිය, ඕපනායක, ගොඩකවෙල | ඉඩම හා මධ්‍යස්ථානයේ අයිතිය පවරාගෙන නොතිබුණි. | මේ සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත තොරතුරු ඉදිරිපත් කර ඇති බව. | දේපළ අයිතිය නිරවුල් කරගත යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | කාරක සභාව/ කාරක සභා | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | පඹහින්න,අම් බැවිල අයගම,බඹර බොටුව දාමහන,දොඩ ම්පෙ ඇහැළියගොඩ, ඇලපාත ඇඹිලිපිටිය,ගි ලීමලේ ගොඩකවෙල, කහවත්ත කොලොන්න, කුරුවිට නිවිතිගල,ඕප නායක පල්ලෙබැද්ද,ප නාමුර පැල්මඩුල්ල, | දීර්ඝ කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.41,469,924ක් වූ ණයගැති ණයහිමි ශේෂ 853ක් 2023 දෙසැම්බර් 31 දින වන විට අයකර ගැනීමටත්/ නිරවුල් කිරීමටත් කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව. | හිඟහිටි ණය ශේෂ නොපමාව අයකර ගැනීමටත්, ණයහිමි ශේෂ නිරවුල් කිරීමටත් කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | පොතුපිටිය<br>වැලිගෙපොල,<br>රත්නපුර<br>කලවාන,රාස්සගල<br>තිඹොල්කැටිය<br>රත්මලවින්න<br>කල්තොට,නාමල්දෙනිය<br>කිරිඇල්ල,මාරපන | | | |
| (ආ) | කලවාන | වසමේ කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරවරුන් 07 දෙනෙකු වෙත විකුණා මුදල් ගෙවීමේ පදනම මත ලබාදුන් රු.118,272ක භාණ්ඩ වෙනුවෙන් අයවිය යුතු මුදල් 2024 මැයි මස දක්වාම අය වී නොතිබුණි. | ඉදිරියේදී අය කර ගැනීමට කටයුතු කරන බව. | හිඟහිටි ණය ශේෂ නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ඇලපාත | මූල්‍ය ප්‍රකාශන වල රු.599,301ක හඳුනා නොගත් ස්ථාවර වත්කම් පැවතිණි. | පිළිතුරු ලැබී නොමැත. | කඩිනමින් ස්ථාවර වත්කම් හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ගොඩකවෙල | බල ප්‍රදේශයට අයත් අමුණු 122ක් පැවැති අතර ඉන් අමුණු 31ක් මැනුම් කර ඊට අදාළ භූමි ප්‍රදේශය ආරක්ෂා කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රතිපාදන ලැබෙන පරිදි මැනුම් කටයුතු කරන බව | කඩිනමින් අමුණුවල මැනුම් කටයුතු කල යුතුය. |
| (ඉ) | ගොඩකවෙල | කෙටි කාලීන භෝග වගා කළ හැකි අක්කර 108 ක් 2023 වර්ෂයේදී වගාකර නොතිබුණ ද, ඊට හේතු පරීක්ෂා කර නොතිබුණි. | ඉදිරියේදි අවශ්‍ය කටයුතු කරන බව | කඩිනමින් වගා කටයුතු ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | ගොඩකවෙල | 2023/24 මහ කන්නයේ වගා කටයුතු ඉටු කළ ගොවීන් 1281 දෙනෙකුගෙන් 412 දෙනෙකු සඳහා අස්වනු නෙලීමෙන් පසුවත් පොහොර සහනාධාර මුදල් ලබා දීම සිදුකර නොතිබුණි. | පොහොර සහනාධාර මුදල් ලබා දීම ප්‍රධාන කාර්යාලය හරහා සිදු කරන බව | විධිමත්ව පොහොර සහනාධාර මුදල් ලබාදීමට කටයුතු කළ යුතුය. |
| (උ) | කල්තොට දාමහන ඇඹිලිපිටිය | අංක7/3/19/S.A.V/2023 හා 2023 ඔක්තෝබර් 06 දිනැති ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයාගේ චක්‍රලේඛය අනුව අපනයන වෙළඳපල ඉලක්ක කර ගනිමින් නව තරුණ කෘෂි ව්‍යවසායකයින් නිර්මාණය සඳහා සැලසුම් කළ සුහුරු ගම්මාන වැඩසටහන යටතේ එක් අයෙකුගෙන් රු.500,000 ක් හා රජයේ දායකත්වය රු.500,000 ක් වශයෙන් මුළු වියදම රු.54,000,000 ක් යොදා හරිත ගෘහ ඒකක 54 ක් ඉදි කිරීමට කටයුතු කළද, තෝරාගත් සැපයුම්කරු සමහ නිවැරදි ගිවිසුම්ගත වීමකින් තොරව ඉදිකිරීම් කටයුතු භාර දීම හේතුවෙන් මාස 06 කට වැඩි කාලයක් | පිළිතුරු ලැබී නොමැත. | සංවර්ධන ව්‍යාපෘති කාර්යක්ෂමව හා ඵලදායීව සිදු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ගත වී තිබුණද හරිතාගාර ඉදි කිරීම් සම්පූර්ණ කිරීම, ජල නල පද්ධතිය ස්ථාපිත කිරීම,වතුර මෝටර් හා ලබා දිය යුතු වගා උපකරණ සැපයීම සම්පූර්ණ කර නොතිබුණි.තවද, ඇතැම් ගොවීන් විසින් විවිධ ආර්ථික අපහසුතා මැද රු.500,000 ක මුදල ණය වශයෙන් ලබා ගෙන මේ සඳහා දායකත්වය ලබා දී තිබූ අතර ව්‍යාපෘති දුර්වලතා හා ප්‍රමාදය හේතුවෙන් ව්‍යාපෘතිය කෙරෙහි තිබූ අභිප්‍රේරණය දුර්වල වී තිබුණි. | | |
| ( ඌ) | නාමල්දෙනිය | i.කුඹුරු ඉඩම් නිශ්චිතව හඳුනා ගැනීමට අවශ්‍ය වැදගත් තොරතුරු ඇතුළත් කරමින් එක් එක් වසමේ නඩත්තු කරන 1995 වර්ෂයේ සිට පවත්වා ගෙන ආ පැරණි කුඹුරු ඉඩම් නාම ලේඛන, එම පැරණි ලේඛනවල තොරතුරු ඇතුළත් කර 2015 වර්ෂයේදී පිළියෙල කළ නව කුඹුරු ඉඩම් නාම ලේඛන සමග සැසැඳීමේදී කුඹුරු ඉඩම් කට්ටි 457 ක වෙනස්කම් පැවතිණි. | පිළිතුරු ලැබී නොමැත. | කුඹුරු ඉඩම් නාම ලේඛන නිවැරදිව පිළියෙල කල යුතුය. |
| | | ii.ඊට හේතු ලෙස කුඹුරු ඉඩම් වසම් | පිළිතුරු ලැබී නොමැත. | - එම- |

දෙකක සටහන් වීම, පැරණි කුඹුරු ඉඩම් නාම ලේඛනයේ ඇතුළත් කුඹුරු ගොඩකිරීම හේතුවෙන් ගොඩ ඉඩමක් වීම නිසා නව කුඹුරු ඉඩම් නාම ලේඛනයට ඇතුළත් කර නොතිබීම, පැරණි කුඹුරු ඉඩම් නාම ලේඛනය අනුව, රජයට අයත්ව තිබුණු සැලකිය යුතු කුඹුරු ප්‍රමාණයක් විවිධ පුද්ගලයින්ට අයිතිය පැවරී ඇති ලෙසට නව කුඹුරු ඉඩම් නාම ලේඛනයට පිටපත් කර තිබීම, පැරණි කුඹුරු ඉඩම් නාම ලේඛනයේ පැහැදිලිව සටහන් කර තිබුණු කුඹුරු ඉඩම් කිසිවක් භෞතිකව පවතින ස්ථානය පෙන්නුම් කිරිමට ගොවිජන සේවා මධ්‍යස්ථානය අපොහොසත් වීම, පැරණි කුඹුරු ඉඩම් නාම ලේඛනයේ නම සටහන්ව තිබුණ ද, වෙනත් වගා සිදු කිරීම නිසා නව කුඹුරු ඉඩම් නාම ලේඛනයට ඇතුළත් නොකළ කුඹුරු ඉඩම් පැවතීම, වෙනත් දිස්ත්‍රික්කයකට අයත් කුඹුරු නාමල්දෙණිය කුඹුරු ඉඩම් නාම ලේඛයේ සඳහන් කර තිබීමත් විය.

| | | |
|---|---|---|
| iii.ඉතා කුඩා නියැදියක් ලෙස ගෙන සිදුකළ පරීක්ෂා කිරීමක දී වුවද, කුඹුරු ඉඩම් නාම ලේඛනය නිසි පරිදි නඩත්තු නොකිරීම නිසා අගතියට පත් මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණය දළ වශයෙන් අක්කර 20ක් පමණ විය. | පිළිතුරු ලැබී නොමැත. | - එම- |
| iv.සිදුකර ඇති මෙම දෝෂ සහගත සටහන් කිරීම්, විනය පාලනය සම්බන්ධයෙන් වූ ආයතන සංග්‍රහයේ II කොටසේ සඳහන් රාජ්‍ය නිලධරයන් විසින් සිදුකළ හැකි වරදවල් සම්බන්ධ පළමුවන උපලේඛනයේ 12 ඡේදයට අනුව, රාජකාරී ලිපි ලේඛන වෙනස් කිරීම, විකෘති කිරීම හා කූට ලේඛන සැකසීමට කටයුතු කිරීමක් ලෙස නිරීක්ෂණය විය. එහෙත්, ආයතන සංග්‍රහයේ II කොටසේ XLVIII පරිච්ඡේදය ප්‍රකාරව අවශ්‍ය විනය පියවර මේ දක්වාමත් ගෙන නොතිබුණි. | පිළිතුරු ලැබී නොමැත. | ආයතන සංග්‍රහයේ II කොටසේ XLVIII පරිච්ඡේදය ප්‍රකාරව අවශ්‍ය විනය පියවර ගත යුතුය. |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල ,පිරියත හා උපකරණ**

| | කාරක සභාව/ කාරක සභා | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | පඹහින්න ඇහැළියගොඩ ඇඹිලිපිටිය කලවාන කිරිඇල්ල | වර්ෂ 04 සිට වර්ෂ 20 දක්වා කාලපරාසයක සිට නිල නිවාස 05ක් නිෂ්කාර්යව පැවැතිණි. | නිල නිවාස අළුත්වැඩියා කිරීමට කටයුතු යොදා ඇති බවත්, නියෝජ්‍ය කොමසාරිස්ගේ උපදෙස් අනුව කටයුතු කරන බවත්ය. | නිල නිවාස අලුත්වැඩියා කර භාවිතයට ගැනිමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කල්තොට | 2020 ඉදිකළ රු. 219,745ක් පිරිවැය වූ ගැමි බොජුන්හල ගොඩනැගිල්ල අදාළ කාර්යය සඳහා 2024 මැයි 13 දින වන විටත් භාවිතා කර නොතිබුණි. | පිළිතුරු ලැබී නොමැත. | කඩිනමින් භාවිතයට ගැනිමට කටයුතු කළ යුතුය. |
| ( ඇ) | පඹහින්න ඇහැළියගොඩ ඇඹිලිපිටිය කහවත්ත කොලොන්න පල්ලෙබැද්ද තිඹොල්කැටිය | රු.626,766 ක වටිනාකමක් ඇති යන්ත්‍ර 07 ක් හා ට්‍රැක්ටරයක් නිෂ්කාර්යව පැවැතිණි. | අදාළ වැඩසටහන ක්‍රියාත්මක නොවීම, අබලන් තත්ත්වයේ පැවතීම ආදී වශයෙන් අදහස් දක්වා තිබීම. | කඩිනමින් භාවිතයට ගැනිමට කටයුතු කළ යුතුය. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| කාරක සභාව/ කාරක සභා | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අයගම ,බඹරබොටුව, ඇලපාත, ගිලීමලේ, ගොඩකවෙල, නිවිතිගල, පොතුපිටිය, තිඹොල්කැටිය, වැලිගපොල | ගොවිජන සේවා මධ්‍යස්ථාන 09 ක 2023 දෙසැම්බර් 31 දිනට කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් 57 ක පුරප්පාඩු පැවැතිණි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට දිස්ත්‍රික් කාර්යාලය දැනුවත් කර ඇති බව. | පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |

## 4. ගොවිජන බැංකු

| | කාරක සභාව/ කාරක සභා | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | පොතුපිටිය | 2014 වර්ෂයේ සිට පවතින රු.246,370ක අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය හා 2015 වර්ෂයේ සිට පවතින රු.35,241ක නොවිසඳුණු ශේෂය විසඳා නොතිබුණි. | ඉදිරියේදි විසඳීමට කටයුතු කරන බව | අවිනිශ්චිත ගිණුම් හා නොවිසඳුණු ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | අම්බැවිල රත්මලවින්න | රු.1,116,065 ක් වූ පරිගණක හා උපකරණ සඳහා ක්ෂය ගැලපීම් සිදු කර නොතිබුණි. | ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගිණුම් නිවැරදිව පාළියෙල කළ යුතුය. |
| (ඇ) | පඹහින්න,අම්බැවිල, අයගම,මාරපන, දාමහන,බඹරබොටුව, දොඩම්පෙ,ඇලපාත, ගිලීමලේ,ඇහැළියගොඩ ,කුරුවිට,කිරිඇල්ල, ඇඹිලිපිටිය,කහවත්ත, නිවිතිගල,ඕපනායක, පනාමුර,පොතුපිටිය, වැලිගපොල,රත්නපුර, කලවාන,තිඹොල්කැටිය ,කල්තොට | ණයලාභීන් 1,322 දෙනෙකුගෙන් 2023 දෙසැම්බර් 31 දිනට හිඟහිටි ශේෂය රු. 24,861,759 ක්ව පැවැතිණි. | මුදල් අයකරමින් පවතින බවත්, ණයකරුවන්ට සිහිකැඳවීම් ලිපි යවා ඇති බවත්, දීර්ඝකාලීනව අයනොවන ශේෂ කපා හැරීම සඳහා ගොවිජන විනිශ්චය සභාව වෙත යොමු කිරීමත්, ඉතිරි ශේෂ සැලසුම්සහගතව අයකර ගැනීමට කටයුතු කරන බවත්ය. | හිඟහිටි ණය කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | පඹහින්න,අයගම දොඩම්පෙ,ඇලපාත ගිලීමලේ,ගොඩකවෙල කොලොන්න,නිවිතිගල ඕපනායක,පැල්මඩුල්ල පොතුපිටිය,කලවාන රාස්සගල ,තිඹොල්කැටිය රත්මලවින්න,කල්තොට නාමල්දෙනිය,කිරිඇල්ල | ණය ගෙවීමේ කාලසීමාව ඉක්මවා ගොස් තිබුණ ද, ණයගැතියන් 218 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 5,818,258 ණය මුදලින් කිසිදු ණය වාරිකයක් සහ පොලියක් ගෙවා නොතිබුණි. | අය කර ගැනීමට කටයුතු කරන බව | හිඟහිටි ණය කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | පඹහින්න,අම්බැවිල අයගම,බඹරබොටුව ඇඹිලිපිටිය,කහවත්ත කොලොන්න,කුරුවිට නිවිතිගල,ඕපනායක පල්ලේබැද්ද,පනාමුර පොතුපිටිය,වැලිගපොල රත්නපුර,කලවාන රාස්සගල ,තිඹොල්කැටිය රත්මලවින්න ,කල්තොට නාමල්දෙනිය,කිරිඇල්ල | මියගොස් තිබුණු ණයගැතියන් 107 ක් හා ආබාධිත 02 දෙනෙකු ගෙන් රු. 1,965,757ක් අයවිය යුතුව තිබුණි | අය කර ගැනීමට කටයුතු කරන බව | හිඟහිටි ණය කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය |
| (ඊ) | පඹහින්න, අම්බැවිල, අයගම, දාමහන, දොඩම්පෙ, ඇලපාත, ඇඹිලිපිටිය, ගිලීමලේ, ගොඩකවෙල, කුරුවිට, කහවත්ත, පනාමුර, කොලොන්න, නිවිතිගල,ඕපනායක, පල්ලේබැද්ද, පැල්මඩුල්ල, පොතුපිටිය, රාස්සගල, වැලිගපොල, රත්නපුර,කලවාන, තිඹොල්කැටිය, රත්මලවින්න, කල්තොට, කිරිඇල්ල, නාමල්දෙනිය, මාරපන | 2023 දෙසැම්බර් 31 දිනට ඉතිරිකිරීම් ගිණුම් 48096කින් ගිණුම් 28132ක් අක්‍රීය තත්ත්වයට පත් වී තිබුණි. | ඉදිරියේ දී අක්‍රීය ගිණුම් සක්‍රීය කර ගැනීමටත්, ඉතිරි කිරීමේ නැමියාව වර්ධනය කිරීමටත් කටයුතු කරන බව. | අක්‍රීය ගිණුම් සක්‍රීය කළ යුතුය. |